# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

## 2021 වසර අවසාන තක්සේරුව

JULY 2022

© Verité Research

# අන්තර්ගතය


අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට .......... 3

ඇගයීම් ක්‍රමවේදය .......... 3

1. විවෘතභාවය .......... 4

1.1. විවෘතභාවය ඇගයීම .......... 4

1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම .......... 4

2. ප්‍රගතිය මැනීම .......... 6

2.1. වියදම් යෝජනාවන්හි ප්‍රගතිය මැනීම .......... 6

2.2. ප්‍රතිපත්ති යෝජනාවන්හි ප්‍රගතිය මැනීම .......... 7

3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර. .......... 8

3.1. වියදම් යෝජනා .......... 8

3.2. ප්‍රතිපත්ති යොජනා .......... 21

වගකීම්හරණය .......... 28

# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

**"අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට"**යනු, අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන publicfinance.lk යටතේ ඇති ඩෑෂ්බෝඩයක් වේ.

ආණ්ඩුව ඉදිරිපත් කරන වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම මෙම ඩෑෂ්බෝඩයේ මූලික අරමුණ වේ.

- රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩෑෂ්බෝඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

1. රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
2. අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

# ඇගයීම් ක්‍රමවේදය

අයවැය කතාවෙහි සඳහන් වියදම් යෝජනා හෙවත් පොරොන්දුවල ප්‍රගතිය "අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට" ඩෑෂ්බෝඩය මගින් විමසා බැලේ. එමෙන්ම, ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැති, නීති සහ රෙගුලාසිවල සංශෝධන ආශ්‍රිත ප්‍රතිපත්ති යෝජනා විමසා බැලීම ද මෙම වේදිකාව විසින් 2019 දී ආරම්භ කරන ලදි. 2021 වසර අවසාන ඇගයීමේ දී වියදම් යෝජනා 31 ක් සහ ප්‍රතිපත්ති යෝජනා 13 ක් ඇගයීමට ලක් කරන ලදි.

| වර්ෂය | වියදම් යෝජනා | | | ප්‍රතිපත්ති යෝජනා |
|---|---|---|---|---|
| | තෝරා ගැනීමේ සීමාව[1] | යෝජනා සංඛ්‍යාව | යෝජනාවල මුළු වටිනාකම | යෝජනා සංඛ්‍යාව |
| 2017 | රු. බිලියන 1 ට වැඩි | 37 | රු. මිලියන 116,910 | 0 |
| 2018 | රු. බිලියන 1 ට වැඩි | 38 | රු. මිලියන 149,350 | 0 |
| 2019 | රු. මිලියන 500 ට වැඩි | 37 | රු. මිලියන 100,875 | 22 |
| 2020[2] | - | 24 | - | 10 |
| 2021 | රු. බිලියන 1 ට වැඩි | 31 | රු. මිලියන 284,000 | 13 |

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම පර්යන්තය මගින් අයවැය යෝජනා විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක දෙක යටතේ ඇගයීමට ලක් කරනු ලැබේ. අර්ධ වාර්ෂික ඇගයීම මගින් අදාළ වසරේ පළමු මාස හය සඳහා වන වියදම් යෝජනාවල

[1] 2017 සහ 2018 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජනා සඳහා වෙන් කිරීමට යෝජනා කරන ලද ප්‍රතිපාදන මත පමණි. අයවැය කතාවේ වාර්තාකරණ ආකෘතිය වෙනස් කිරීම හේතුවෙන් 2019 දී තෝරා ගැනීමේ සීමාව, යෝජිත ප්‍රතිපාදන ප්‍රමාණයේත්, ඒ වන විට ඒ සඳහා වෙන් කර තිබූ මුදලේත් එකතුව මත පදනම් විය.

[2] 2020 වසරේ අයවැය කතාවක් නොපැවැත්වුණු අතර ඒ හේතුවෙන්, අයවැය යෝජනා වෙනුවට එම වසරේ ජනවාරි සිට ජූනි දක්වා ඉදිරිපත් කරන ලද වියදම් යෝජනා සහ ප්‍රතිපත්ති යෝජනා ඇතුළත් කැබිනට් තීරණ 24ක් පිළිබඳව මෙම වේදිකාව විසින් විමසා බලන ලදි. තීරණය ක්‍රියාත්මක කරන ආයතනයක් හඳුනාගත හැකි වීම සහ අධීක්ෂණය කළ හැකි අවසන් ප්‍රතිඵලයක් ඇතුළත් වීම යන කරුණු මත පදනම්ව ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ තෝරා ගන්නා ලදි. පාස්කු ඉරිදා ප්‍රහාරයේ බලපෑම හේතුවෙන් 2019 වසරේ ඇතැම් අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම අඩාල විය. එබැවින්, 2019 අයවැය කතාවෙන් ඉදිරිපත් වූ, එහෙත් එම වසරේ සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක නොවූ එවන් අයවැය යෝජනා 8ක ප්‍රගතිය ද 2020 දී ඇගයීමට ලක් කරන ලදි.

ප්‍රගතිය සහ විවෘතභාවය ඇගයීමට ලක් කෙරේ. වාර්ෂික ඇගයීම, වියදම් සහ ප්‍රතිපත්ති යෝජනා යන දෙවර්ගයේම ප්‍රගතිය සහ විවෘතභාවය සලකා බලයි. වාර්ෂික ඇගයීමේදී විවෘතභාවය පිළිබඳ දර්ශකය සැකසීමේදී වියදම් සහ ප්‍රතිපත්ති යෝජනා යන දෙවර්ගයේම විවෘතභාවයට අදාළ තක්සේරුව ඒකාබද්ධ කරනු ලැබේ.

2021 වසර අවසාන ඇගයීම් සඳහා, සියලුම යෝජනා සඳහා තොරතුරු ලබා ගැනීමේ (RTI) අයදුම්පත්, 2022 පෙබරවාරි 28 වැනි දින ගොනු කරන ලදි. 1. ඒ අනුව, පෙබරවාරි 28 වැනිදා සිට අප්‍රේල් 30 වැනිදා දක්වා ලැබුණු තොරතුරු, ඇගයීම සඳහා සලකා බලන ලදි. තොරතුරු ලබා ගැනීමේ කාල සීමාව 2016 අංක 12 දරන තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මත පදනම් විය. එහෙත්, රට තුළ පැවති අවිනිශ්චිත තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ඇගයීම සඳහා තොරතුරු ලබා දීම සඳහා අතිරේක සති දෙකක කාලයක් ලබා දීමට තීරණය කරන ලද අතර එමගින් දත්ත රැස් කිරීමේ කාලය 2022 මැයි 10 දක්වා දීර්ඝ විය. මෙම කාල සීමාව ඉක්මවා ලැබුණු කිසිදු තොරතුරක් ඇගයීම් සඳහා සැලකිල්ලට ගනු නොලැබිණි.

# 1. විවෘතභාවය

## 1.1. විවෘතභාවය ඇගයීම

තෝරාගත් යෝජනා/පොරොන්දු සම්බන්ධයෙන් ගනු ලබන පියවර පිළිබඳව රජය විසින් කෙතරම් දුරට විස්තර ලබා දෙන්නේ ද යන්න මෙම දර්ශකය මගින් විමසා බැලේ. පොරොන්දුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කොපමණ දුරට රජය හෙළිදරව් කරන්නේ ද යන්න මෙමගින් ඇගයීමට ලක් කෙරේ. මේ සඳහා අවශ්‍ය තොරතුරු අදාළ රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවි පරීක්ෂා කිරීම සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (RTI) යටතේ රාජ්‍ය ආයතන වෙත තොරතුරු ඉල්ලුම් පත්‍ර ගොනු කිරීම මගින් රැස්කර ඇත. 2017 සහ 2018 වර්ෂවලදී තොරතුරු රැස් කිරීම, රජයේ ආයතන වෙත ගොස් අදාළ නිලධාරීන් හමු වීම ඔස්සේ මෙන්ම එම ආයතන වෙත ගොනු කරන ලද නිල නොවන ඉල්ලීම් ඔස්සේ ද සිදු විය. කෙසේ වෙතත්, තොරතුරු රැස් කිරීමේ මෙම ක්‍රමවේදය මේ වනවිට අත්හිටුවා ඇත.

රජය විසින් යම් වර්ෂයක පළමු මාස හය තුළ වියදම් යෝජනාවල ප්‍රගතිය පිළබඳ තොරතුරු හෙළිදරව් කිරීමේදී කෙතරම් විවෘතභාවයක් පෙන්නුම් කර ඇත් ද යන්න තක්සේරු කිරීම අර්ධ වාර්ෂික ඇගයීමේදී සිදු කරනු ලැබේ. සම්පූර්ණ වසරක කාලයක් තුළ වැය සහ ප්‍රතිපත්ති යෝජනා යන දෙවර්ගයෙහිම ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමේදී රජය කෙතරම් දුරට විවෘතභාවයක් පෙන්නුම් කර ඇත් ද යන්න තක්සේරු කිරීම වාර්ෂික ඇගයීමේදී සිදු කරනු ලැබේ.[3]

ඇගයීම සිදු කරනු ලබන අවස්ථාවේදී ලබා ගත හැකි තොරතුරු මත විවෘතභාවය පදනම් වන අතර, එය පහත පරිදි වර්ගීකරණය කර ඇත


සංවෘත - ඇගයීම සිදු කරනු ලබන සම්පූර්ණ කාලසීමාවට අදාළව ප්‍රගතිය නිර්ණය කිරීම සඳහා අවශ්‍ය කිසිදු තොරතුරක් නොමැත


සීමිත- ලැබී ඇති තොරතුරු, ඇගයීම සිදු කරනු ලබන සම්පූර්ණ කාලසීමාවට අදාළව ප්‍රගතිය නිර්ණය කිරීම සඳහා ප්‍රමාණවත් නොමැත


උදාසීන- ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට සහ/හෝ ලබා දුන් තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය ඇගයීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය


සාධනීය- අයවැය පොරොන්දුවේ ප්‍රගතිය පිළිබඳතොරතුරු අදාළ කාලය තුළ ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකි විය


විවෘත- පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත

## 1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම

එක් එක් රාජ්‍ය ආයතනය විසින් තමන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පොරොන්දු පිළබඳ තොරතුරු හෙළිදරව් කිරීමේදී පෙන්නුම් කරන ලද විවෘතභාවය පිළිබඳ සංසන්දනාත්මක ශ්‍රේණිගත කිරීමක් මෙමගින් සපයනු ලැබේ. සෑම ආයතනයකටම 0 සිට 100 දක්වා ලකුණු හිමි වන අතර, ලකුණු 100 ක් හිමි වීමෙන් හැඟවෙන්නේ විවෘතභාවය උපරිම මට්ටමින් පෙන්නුම් කර ඇති බවයි. අනතුරුව, අදාළ වර්ෂය තුළ රජයේ ආයතනවල එකිනෙකට සාපේක්ෂ කාර්ය සාධනය පෙන්නුම් කරමින්, වැඩිම ලකුණු ගත් ආයතනයේ සිට අඩුම ලකුණු ගත් ආයතනය දක්වා රාජ්‍ය ආයතන ඉහළ සිට පහළට ශ්‍රේණිගත කරනු ලැබේ. යම් රාජ්‍ය ආයතනයන් යටතේ පවතින සියලුම පොරොන්දුවල ලකුණුවල බර තබන ලද සාමාන්‍යයක් ලෙස එම රාජ්‍ය ආයතනයේ සමුච්චිත


---

[3] ප්‍රතිපත්ති යෝජනාවල විවෘතභාවය 2020 වර්ෂයේ සිට ඇගයීමට ලක් කරන ලදි.

ලකුණු ප්‍රමාණය ගණනය කරනු ලැබේ. සෑම පොරොන්දුවක් සඳහාම 0 සිට 100 දක්වා පරාසයක් තුළ ලකුණු දෙනු ලැබේ. (i) ආයතන වෙතින් ලැබුණු තොරතුරු අදාළ පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමේදී කොපමණ දුරට ප්‍රයෝජනවත් වූයේ ද යන්න සහ (ii) කෙතරම් පහසුවෙන් එම තොරතුරු ලබා ගත හැකි වූයේ ද යන කරුණු දෙක මත පදනම්ව එක් එක් අයවැය පොරොන්දුව සඳහා හිමි වන ලකුණු ප්‍රමාණය ගණනය කෙරේ.

**තොරතුරු භාවිතයට සුදුසු වීම/ භාවිතා කිරීමේ හැකියාව:** ආයතන වෙතින් ලැබුණු තොරතුරු, මුළුමනින්ම ප්‍රයෝජනයට ගත හැකි වීම හෝ තරමක් දුරට ප්‍රයෝජනයට ගත හැකි වීම හෝ කිසිසේත්ම ප්‍රයෝජනයට ගත නොහැකි වීම හෝ යන කරුණු මත සෑම පොරොන්දුවක් සඳහාම පිළිවෙලින් 100, 50 සහ 0 වශයෙන් ආරම්භක ලකුණු ප්‍රමාණයක් හිමි වේ.

**තොරතුරු ලබා ගැනීමේ පහසුව:** ලබාගත් තොරතුරුවල ප්‍රයෝජනවත් බව අනුව ලබා දුන් ආරම්භක ලකුණු ප්‍රමණාය, එම තොරතුරු ලබා ගැනීමේ පහසුව පදනම් කරගනිමින් නැවත සංශෝධනය කරනු ලැබේ. මෙහිදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලුම් කිරීමෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවට සාපේක්ෂව අන්තර්ජාලය හරහා තොරතුරු ලබා ගැනීමට හැකි වීම (එනම්, ප්‍රගාමී හෙළිදරව් කිරීම) වෙනුවෙන් වැඩි ලකුණු ප්‍රමාණයක් හිමි වේ.



# 2. ප්‍රගතිය මැනීම

## 2.1. වියදම් යෝජනාවන්හි ප්‍රගතිය මැනීම

රජය විසින් තමන් ලබා දුන් අයවැය පොරොන්දු කෙතරම් දුරට ඉටු කරන්නේ ද යන්න මෙම දර්ශකය මගින් විමසා බැලේ. මෙහිදී, රජය විසින් පොරොන්දු ඉටු කිරීමේදී අත්කර ගෙන ඇති ප්‍රගතිය, පොරොන්දු ඉටු කිරීමෙහිලා වගකිව යුතු රාජ්‍ය ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද කාලසීමාවන් හා ඉලක්ක පදනම් කර ගනිමින් ඇගයීමට ලක්කරයි.

අයවැය පොරොන්දුවල ***<u>අර්ධ වාර්ෂික ප්‍රගතිය</u>*** පහත පරිදි වර්ගීකරණය කර ඇත:

| | |
|---|---|
| හෙළිදරව් කර නොමැත | පොරොන්දුව පිළිබඳ කිසිදු තොරතුරක් නොමැති වීම හෝ පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීම සඳහා භාවිතා කළ නොහැකි වීම |
| කඩ කර ඇත | මෙම පොරොන්දුව අතහැර දමා හෝ කල් දමා හෝ ඇති අතර තක්සේරු වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත |
| නොසලකා හැර ඇත | මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත |
| මන්දගාමී ප්‍රගතියක් ඇත | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදු කිරීමට අසමත් වී ඇත |
| සතුටුදායක ප්‍රගතියක් ඇත- | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවමින් පවතින අතර නියමිත කාලය තුළ හෝ ඊට ප්‍රථම සිදු වෙමින් පවතී[4] |

අයවැය පොරොන්දුවල ***<u>වාර්ෂික ප්‍රගතිය</u>*** පහත පරිදි වර්ගීකරණය කර ඇත:

| | |
|---|---|
| හෙළිදරව් කර නොමැත | ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය කිසිදු තොරතුරක් නොමැති වීම හෝ පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නොවීම/ ප්‍රයෝජනයට ගත නොහැකි වීම |
| කඩ කර ඇත | වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර තිබීම හෝ අදාළ වර්ෂය තුළ කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොතිබීම |
| දුර්වලයි | ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |
| අර්ධසම්පූර්ණයි | ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |

[4] කිසියම් අයවැය වර්ෂයක් තුළ ජූනි 30 වැනි දින වන විට අත් කර ගෙන ඇති ප්‍රගතිය එම කාලසීමාව සඳහා ලබා දී තිබූ ඉලක්කයෙන් 90% ක පරාසයක් තුළ පවතින්නේ නම් ඊට සතුටුදායක ප්‍රගතියක් ඇතැයි සැලකේ.

| | |
|---|---|
| සැලකිය යුතුයි | ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% ත් අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |
| සම්පූර්ණයි | ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |

## 2.2. ප්‍රතිපත්ති යෝජනාවන්හි ප්‍රගතිය මැනීම

2019 දී BudgetPromises.Org විසින් අයවැය කතාවේ දී රජය විසින් ලබා දෙන ලද ප්‍රතිපත්ති පොරොන්දුවල ප්‍රගතිය ඇගයීමට හැකි වන සේ සිය විෂය පථය පුළුල් කරන ලදි. මෙම යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොවේ.

ක්‍රියාත්මක කර ඇත් ද යන බව නිර්ණය කිරීම සඳහා නීති සම්මත කිරීමක් හෝ රෙගුලාසිමය දැනුම් දීමක් (ගැසට් නිවේදන) හෝ අවශ්‍ය වන යෝජනා මෙම ඇගයීම සඳහා තෝරා ගන්නා ලදි. ගැසට් නිවේදන, රජයේ චක්‍රලේඛ, කැබිනට් තීරණ පිළිබඳ රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ නිවේදන වැනි මහජනතාවට ප්‍රවේශ විය හැකි තොරතුරු සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ අදාළ අධීක්ෂණ ආයතන වෙත ගොනු කරන ලද තොරතුරු ඉල්ලීම් හරහා මෙම ඇගයීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදි.

අයවැය කතාව තුළින් හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රජය ලබා ඇති ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | |
|---|---|
| හෙළිදරව් කර නොමැත | ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය කිසිදු තොරතුරක් නොමැති වීම හෝ පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් නොවීම/භාවිතයට ගත නොහැකි වීම |
| ක්‍රියාත්මක කර නැත | යෝජනාවෙහි එක් අංගයක් සම්බන්ධයෙන් හෝ අවශ්‍ය නීති සමමත කිරීමක් හෝ රෙගුලාසිමය දැනුම් දීමක් (ගැසට්)සිදු කර නොමැත /අදාළ අමාත්‍යාංශය/ රජයේ .ආයතනය විසින් මෙය ලිඛිතව සනාථ කර ඇත |
| අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත | යෝජනාවේ ඇතැම් අංග සඳහා පමණක් නීති සම්මත කිරීමක් හෝ රෙගුලාසිමය දැනුම් දීමක් (ගැසට්) සිදු කර ඇත |
| සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත | ප්‍රතිපත්ති යෝජනාව මුළුමනින්ම ක්‍රියාත්මක කර ඇත .යෝජනාවේ සම්පූර්ණ විෂය පථය සඳහා අවශ්‍ය නීති සම්මත කර ගැනීම හෝ රෙගුලාසිමය දැනුම් දීමක් (ගැසට්) හෝ සිදු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් වැඩිදුර පියවර අවශ්‍ය නොවේ. |

# 3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර.

## 3.1. වියදම් යෝජනා

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | රාජ්‍ය ආයතනය |
|---|---|---|---|
| සියලු දෙනා සඳහා ජලය 2021 | **ප්‍රතිචාරාත්මකයි** | **දුර්වලයි** | ජල සම්පාදන අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටි අතර ඊට ප්‍රතිචාරයක් ලැබිණ. ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා එම තොරතුරු ප්‍රමාණවත් විය. | මෙම යෝජනාව 2021-2025 කාලරාමුව සහිත බහුවාර්ෂික ව්‍යාපෘතියකි. 2021 අයවැය ප්‍රගතිය නම් ලේඛනයෙහි ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ වූ යෝජනා කිහිපයකම ප්‍රගතිය දක්වා තිබිණ. එහි 'සියලු දෙනා සඳහා ජලය' ව්‍යාපෘතිය පිළිබඳව සඳහන් වන්නේ එක් ස්ථානයක පමණක් වන අතර එම සඳහන මූල්‍ය ප්‍රගතිය හා සම්බන්ධ වූවකි. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය යටත් පිරිසෙයින් එක් වරක් හෝ සංශෝධනය කර ඇති බව පවතින දත්ත ඇසුරින් පෙනී යයි. එලෙස සංශෝධනය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 27,657 බවට මධ්‍ය වාර්ෂික ඇගයීමේ දී නිරීක්ෂණය කරන ලදී. 2021 වසර සඳහා අවසන් වරට සංශෝධනය වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 29,567 ක් වන අතර, 26% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කරමින් ඉන් රු. මිලියන 7,624ක් වියදම් කර ඇත. වෙන් කරන ලද ප්‍රතිපාදන මෙලෙස නිරන්තරයෙන් නැවත ඇගයීමට ලක් කිරීම වෙනුවෙන් කිසිදු සාධාරණීකරණයක් හෝ හේතු දැක්වීමක් සිදු කර නොමැත. | |
| පානීය ජලය | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | ජල සම්පාදන අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටි අතර ඊට ප්‍රතිචාරයක් ලැබිණ. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට ගැනෙන ව්‍යාපෘති | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ඔස්සේ තොරතුරු ලබා ගැනීමට හැකි වුව ද, එම තොරතුරු යෝජනාවට අදාළ නොවීය. එම | |

| | | | |
|---|---|---|---|
| | සියල්ලටම අදාළ තොරතුරු මෙම ප්‍රතිචාරයට ඇතුළත්ව තිබූ නමුදු ''පානීය ජලය'' ව්‍යාපෘති යෝජනාවට අදාළ තොරතුරු හඳුනා ගැනීම අසීරු විය. එම නිසා, ප්‍රගතිය තක්සේරු කිරීමේදී එම තොරතුරුවලින් ප්‍රයෝජනයක් අත් නොවිණ. | නිසා, මෙම යෝජනාවේ ප්‍රගතිය සම්බන්ධයෙන් කිසිදු තක්සේරුවක් සිදු කිරීමට නොහැකි විය. | |
| ජාතික ආරක්ෂාව | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | ආරක්ෂක අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටි අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණ. එමෙන්ම, 2021 අයවැය සම්බන්ධයෙන් මධ්‍ය වාර්ෂික ඇගයීම සිදු කිරීමේදී ද තොරතුරු දැන ගැනීම සඳහා ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත්, නීතිය බලාත්මක කිරීමට හෝ ජාතික ආරක්ෂාවට හෝ අදාළ රහස්‍ය තොරතුරු මූලාශ්‍රයක අනන්‍යතාව හෙළිදරව් වීමට ඉඩ තිබීම යන කාරණාව මත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ඌ):(සස)* වගන්තිය යටතේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී | යෝජනාවේ ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා ගත නොහැකි විය. | |
| කි.මී. 100,000 මාර්ග වැඩසටහන | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | අධිවේගී මාර්ග අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටි අතර, ඉල්ලීම භාර ගත් බවට දැනුම් දීමක් සිදු කළ ද ඊට ප්‍රතිචාරයක් නොලැබිණ. මීට අදාළ තොරතුරු ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන බව අමාත්‍යාංශය වෙත ගොස් අදාළ නියෝජිතයින් හමු වූ අවස්ථාවේදී ඔවුන් විසින් සහතික කරන ලද නමුදු එවැනි කිසිදු තොරතුර් ලබා දීමට කටයුතු කර නොමැත. | යෝජනාවේ ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා නොදෙන ලද අතර අන්තර්ජාලය ඔස්සේ ද එම තොරතුරු පළ කර නොතිබිණ. | |
| ග්‍රාමීය පාලම් සංවර්ධනය | **ආවෘත** | **හෙළිදරව් කර නොමැත** | අධිවේගී මාර්ග අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටි අතර එම ඉල්ලීම ලැබුණු බවට දැනුම්දීමක් සිදු කළ නමුත් තොරතුරු කිසිවක් නොලැබිණ. මීට අදාළ තොරතුරු ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන බව අමාත්‍යාංශය වෙත ගොස් මේ පිළිබඳ විමසූ අවස්ථාවේදී අදාළ | යෝජනාවේ ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා නොදෙන ලද අතර අන්තර්ජාලය ඔස්සේ ද එම තොරතුරු පළ කර නොතිබිණ. | |

| | | | |
|---|---|---|---|
| | නියෝජිතයින් සහතික කළ නමුදු එවැනි කිසිදු තොරතුරක් ලබා දීමට කටයුතු කර නොමැත. | | |
| ‘‘ගමට සන්නිවේදනය’’ | **සහය නොදක්වන ලදි**<br>තොරතුරු සීමිත වශයෙන් අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර ඇත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තාක්ෂණ අමාත්‍යාංශයෙන් තොරතුරු ඉල්ලා සිටි අතර එම අමාත්‍යාංශය එකී ඉල්ලීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද තොරතුරු ඇගයීමක් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. කෙසේ වෙතත්, අනෙකුත් අයවැය පොරොන්දුවලට අදාළව ගොනු කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් තාක්ෂණ අමාත්‍යාශය තොරතුරු ලබා දුන් අතර ‘ගමට සන්නිවේදනය’ ව්‍යාපෘති යෝජනාව හා සම්බන්ධ තොරතුරු ද ඊට ඇතුළත්ව තිබිණ. | **ඉටු කරන ලදි**<br>මෙය, 2021-2023 කාලරාමුව සහිත බහු-වාර්ෂික ව්‍යාපෘතියකි. ප්‍රකාශිත ඉලක්ක මත පදනම්ව බැලූ කළ 2021 වසර සඳහා ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය 94% ක් ලෙස සඳහන් වන අතර ඒ අනුව එය ඉටු කර ඇති පොරොන්දුවක් ලෙස සලකන ලදි. කෙසේ වෙතත්, 2021 වසර සඳහා වූ ක්‍රියාකාරකම් අතරට සමීක්ෂණ පැවැත්වීම, යටිතලපහසුකම්වලට අදාළ වැදගත් ප්‍රදේශ හඳුනා ගැනීම, සන්නිවේදන කුළුණු ඉදිකිරීමට සැලසුම් කිරීම ආදී මූලික කාර්යයන් ඇතුළත්ව ඇති බව ද මෙහිදී සැලකිය යුතුය. මෙය බහු-වාර්ෂික ව්‍යාපෘතියක් වන හෙයින් මීට ඇතුළත් කාර්යයන්ගෙන් බහුතරය ඉදිරි වසරවලදී සම්පූර්ණ කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන බව සඳහන් කළ යුතුය. | තාක්ෂණ අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |
| තාක්ෂණික උද්‍යාන | **සහය නොදක්වන ලදි**<br>තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලදි. තොරතුරු ඉල්ලීම තාක්ෂණ අමාත්‍යාංශය වෙත ගොනු කරන ලද නමුත් එකී අමාත්‍යාංශය සමග කිසිදු ආකාරයක සබඳතාවක් ඇති කර ගැනීම මෙන්ම ප්‍රතිචාරයක් ලබා ගැනීම ද අතිශයින්ම දුෂ්කර විය. එම නිසා අමාත්‍යාංශය වෙත ගොස් ඒ පිළිබඳව විමසීමට පර්යේෂකයින්ට සිදු වූ අතර තොරතුරු ලබා ගැනීමට හැකි වූයේ ඉන් අනතුරුවය. එලෙස ලබා ගත් තොරතුරු අපැහැදිලි වූ අතර ඒ ඇසුරින් තක්සේරුවක් සිදු කිරීම සඳහා සැලකිය යුතු ප්‍රයත්නයක් දැරීමට සිදු විය. | **අර්ධ සම්පූර්ණයි**<br>ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම යෝජනාව රු. මිලියන 50,000ක මුළු ප්‍රතිපාදන ප්‍රමාණයක් සහිතව 2021-2023 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. එය බහු-වාර්ෂික ව්‍යාපෘතියක් බව ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් වුව ද, ඒ ඒ වසරට අදාළ ප්‍රතිපාදන ප්‍රමාණය බෙදා වෙන් කර දක්වා නොමැත. එම නිසා, 2021 අයවැය කතාව හරහා වෙන් කර ඇති රු. මිලියන 10,000ක ප්‍රතිපාදන නිවැරදි යැයි ගෙන ඇත. ගාල්ල, කුරුණෑගල, මහනුවර, නුවර එළිය සහ හබරණ යන ප්‍රදේශවල තාක්ෂණික උද්‍යාන පහක් ස්ථාපිත කිරීමට නියමිතව ඇති බව ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්වේ. මෙම උද්‍යාන 5 සඳහාම ඉඩම් තෝරා අවසන් වන අතර අවශ්‍ය වන කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකු අතරින් 4 දෙනෙකු ද තෝරා පත් කර ඇත. එම තාක්ෂණික උද්‍යාන 5 අතරින් 2ක් භෞතික ප්‍රගතියක් අත් කරගෙන ඇති බව ප්‍රගති වාර්තාවෙහි දක්වා තිබුණ ද ප්‍රගතියේ මට්ටම | තාක්ෂණ අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | | පිළිබඳ සඳහනක් එහි නොමැත. එමෙන්ම, මෙම තාක්ෂණික උද්‍යාන පිහිටුවීමටත් එම උද්‍යාන කළමනාකරණය කිරීමටත් "ටෙක්නෝ පාර්ක් ඩිවෙලෙප්මන්ට් පුද්ගලික සමාගම" නමින් සමාගමක් පිහිටුවිය යුතු බව ද එම ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් වේ. 2021 සැප්තැම්බර් 06 දින එළැඹෙන ලද කැබිනට් මණ්ඩල තීරණයට අනුව, ඉහත කී සමාගම මහා භාණ්ඩාගාරයේ පූර්ණ හිමිකාරිත්වය යටතේ පවතින සමාගමක් ලෙස පිහිටුවීමටත් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි කිරීමටත් සැලසුම් කර ඇත. | |
| තාක්ෂණික වැඩිදියුණු කිරීම් | **සීමිත**<br>තොරතුරු ප්‍රගාමී වශයෙන් අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටි අතර ඊට ප්‍රතිචාරයක් නොලැබුණු අතර කිසිදු ආකාරයක සබඳතාවක් ඇති කර ගැනීම අතිශයින්ම දුෂ්කර විය. එම නිසා අමාත්‍යාංශය වෙත ගොස් ඒ පිළිබඳ විමසීමට පර්යේෂකයින්ට සිදු වූ අතර තොරතුරු ලබා ගැනීමට හැකි වූයේ ඉන් අනතුරුවය. ඇගයීම් වර්ෂය සඳහා කිසිදු ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කර නොතිබුණු හෙයින් ලබා ගත හැකි වූයේ ප්‍රගති වාර්තාවක් පමණි. ලබා දුන් තොරතුරුවල ''තාක්ෂණික වැඩදියුණු කිරීම්වලට'' අදාළ තොරතුරු හඳුනා ගැනීම අපහසු විය. | **හෙළිදරව් කර නොමැත**<br>''තාක්ෂණික වැඩිදියුණු කිරීම්'' පොරොන්දුවට අදාළව පැහැලිදිව හඳුනා ගත හැකි තොරතුරු අමාත්‍යාංශය ලබා දුන් ප්‍රගති වාර්තාවෙහි ඇතුළත් නොවේ. එම නිසා, මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | තාක්ෂණ අමාත්‍යාංශය |
| අලි-මිනිස් ගැටුම | **සහය නොදක්වන ලදි**<br>තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලදි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියමිත කාලය ඇතුළත තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වූ අතර ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා එම තොරතුරු ප්‍රමාණවත් විය. | **අර්ධ සම්පූර්ණයි**<br>ප්‍රගති වාර්තාවට අනුව විදුලි වැට ඉදිකිරීමේ ප්‍රගතිය 50.87% ක් ලෙස වාර්තා වන අතර එම නිසා, මෙම ව්‍යාපෘති යෝජනාවේ ප්‍රගතිය අර්ධ වශයෙන් සම්පූර්ණ බවට සැලකේ. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| වන සංරක්ෂණය | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිය අධීක්ෂණය යටතේ සිදු කෙරෙන ව්‍යාපෘති ක්‍රියාකාරකම් සියල්ලෙහිම ප්‍රගතිය පිළිබඳ විස්තර මෙන්ම මූල්‍ය ඉලක්කවලට අදාළ තොරතුරු ද ලබා දෙන ලද අතර මෙම අයවැය යෝජනාවට අදාළ තොරතුරු එහිදී වෙන් කොට දක්වා නොතිබිණ. එම නිසා, තොරතුරු යම් ප්‍රමාණයක් ලබා දී තිබුණ ද අයවැය යෝජනාව පිළිබඳ තක්සේරුවක් සිදු කිරීම සඳහා එය ප්‍රමාණවත් නොවීය. | ප්‍රගති වාර්තාව ලබා ගත හැකි වුව ද මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි තොරතුරු නොලැබිණ. | |
| සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සවිබල ගැන්වීම | **විවෘත**<br>‘2021 සිව්වන කාර්තුව අවසන් වන විට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ලබා තිබූ ප්‍රගතිය’ නම් වාර්තාව හරහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අදාළ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෙළිදරව් කර තිබිණ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ද ඉල්ලීමක් සිදු කළ නමුදු ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු අතර අදාළ රජයේ ආයතනය සමඟ සබඳතාවක් ගොඩ නඟා ගැනීමට දැරූ ප්‍රයත්න නිරර්ථක විය. | **සැලකිය යුතුයි**<br>2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය 67% ක් ලෙස ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිව්වන කාර්තුව සඳහා වන වාර්තාවෙහි දැක්වේ. ඒ අනුව, අත් කර ගෙන ඇති ප්‍රගති මට්ටම් පිළිබඳ නිර්වචනයට අනුව මෙම අයවැය පොරොන්දුව සැලකිය යුතු තරමේ ප්‍රගතියක් සාක්ෂාත් කර ගෙන ඇති බව පැවසිය හැක. | මුදල් අමාත්‍යාංශයේ සමෘද්ධි දෙපාර්තමේන්තුව |
| තරුණ කාන්තා ව්‍යවසායකයින් | **සීමිත**<br>තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. මධ්‍ය වාර්ෂික ඇගයීම සිදු කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරයට අනුව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය, සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය සහ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත තොරතුරු ඉල්ලීම් ගොනු කරන ලදි. සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය ඊට දැක්වූ ප්‍රතිචාරය වූයේ එම යෝජනාව සිය විෂය පථයට අයත් නොවන්නක් බව පැවසීමයි. සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය සහ තරුණ හා ක්‍රීඩා අමත්‍යාංශය එම | **හෙළිදරව් කර නොමැත**<br>මෙම අයවැය පොරොන්දුව අධිවේගී මාර්ග අමාත්‍යාංශය විසින් කි.මී. 100,000 මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරෙනු ඇති බව කැබිනට් තීරණයෙහි සඳහන් විය. ඒ අනුව, එම අයවැය පොරොන්දුව ආශ්‍රිත තොරතුරු එකී කි.මී. 100,000 මාර්ග ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරී සැලැස්මෙහිත් ප්‍රගති වාර්තාවෙහිත් ඇතුළත්ව තිබිය යුතුය. එම නිසා, කි.මී. 100,000 මාර්ග ව්‍යාපෘති වැඩසටහන ද පරීක්ෂාවට ලක් කරන ලද අතර අධිවේගී මාර්ග අමාත්‍යාංශය වෙත ද තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමක් ගොනු කළ ද ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණ. එබැවින්, යෝජනාවේ ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම සඳහා | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම භාර ගත් බවට දැනුම් දීමක් හෝ ඊට ප්‍රතිචාර දැක්වීමක් හෝ සිදු නොකළේය. එම ව්‍යාපෘතියෙහි අධීක්ෂණ ආයතනය ලෙස සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය ද ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස අධිවේගී මාර්ග අමාත්‍යාංශය ද නම් කර තිබූ කැබිනට් තීරණයක් මෙම යෝජනාව සම්බන්ධයෙන් අන්තර්ජාලය තුළ සිදු කරන ලද පරීක්ෂාවන්හි ප්‍රතිඵලයක් ලෙස හමු විය. මෙම යෝජනාවට අදාළ ආයතනය සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය වන බවට වසර අවසාන ඇගයීම සිදු කිරීමේදී ද ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හඟවනු ලැබූ නිසා එම රාජ්‍ය අමාත්‍යාංශය වෙත ද තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, ඊට ලැබුණු ප්‍රතිචාරයෙහි සඳහන් වූයේ එම ව්‍යාපෘතිය එකී අමාත්‍යාංශයේ අධීක්ෂණ පථයට අයත් නොවන බව වූ අතර වෙනත් ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් ද එහි සඳහන් කර නොතිබිණ. | අවශ්‍ය තොරතුරු කිසිවක් අදාළ ආයතන වෙතින් නොලැබුණු අතර අන්තර්ජාලය ඔස්සේ ද එම තොරතුරු පළ කර නොතිබිණ. | |
| නීති අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය | **සහය නොදක්වන ලදි** | **දුර්වලයි** | අධිකරණ අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සහ ප්‍රගති වාර්තාවක් ලබා දෙන ලදි. කෙසේ වෙතත්, එම ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව අතර පරස්පරතාවක් පවතී. එබැවින්, පොරොන්දුව ඇගයීම සඳහා සැලකිය යුතු මට්ටමේ ප්‍රයත්නයක් දැරීමට සිදු විය. | මෙය, 2021-2023 කාලරාමුව සහිත බහු-වාර්ෂික ව්‍යාපෘතියකි. ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව අතර ඇති පරස්පරතාව හේතුවෙන් තක්සේරුවක් සිදු කිරීම වෙනුවෙන් එහි භෞතික ප්‍රගතිය උපයෝගි කරගත නොහැකි විය. එම නිසා, ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා මූල්‍ය ප්‍රගතිය යොදා ගැනිණ. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය 21% ක් ලෙස වාර්තා විය. එම නිසා එම ප්‍රගතිය දුර්වල වශයෙන් වර්ගීකරණය වේ. | |
| ග්‍රාමීය රෝහල් සංවර්ධනය | **ප්‍රතිචාරාත්මකයි** | **කඩකර ඇත** | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | සීමිත තොරතුරු ප්‍රමාණයක් අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයත් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශයත් මෙම පොරොන්දුව සඳහා වගකිව යුතු ආයතන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලදි. කෙසේ වෙතත්, මධ්‍ය වාර්ෂික ඇගයීම සිදු කිරීමේදී තොරතුරු දැනගැනීමේ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය | ප්‍රතිපාදන වෙන් කරන ලද බවට සාක්ෂි පැවතිය ද මෙය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ලැබුණු තොරතුරුවලට පරස්පර විරෝධී වේ. තව ද, එම ප්‍රතිපාදන භාවිතයට ගත් බවට සාක්ෂි නොපවතින බැවින් මෙම පොරොන්දුව කඩ කර ඇත්තාක් සේ වර්ගීකරණය කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| | විසින් සඳහන් කරන ලද්දේ මෙම යෝජනාව එම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවන බවයි. එබැවින්, වසර අවසාන ඇගයීම සිදු කිරීමේදී තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ගොනු කරන ලද අතර මෙම යෝජනාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තමන්ට ලැබී නොමැති බව සඳහන් කරමින් අමාත්‍යාංශය විසින් ඊට ප්‍රතිචාර දක්වන ලදි. මෙය මධ්‍ය වාර්ෂික ඇගයීම සිදු කිරීමේදීසෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ලැබුණු පිළිතුර හා සම වේ. එනමුත්, 2022 අයවැය ඇස්තමේන්තුවලට අනුව මෙම යෝජනාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාත් 9 (රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන ආයතනයේ විෂය පථයට මෙය අයත් වේ) සඳහා ලබා දී ඇත. | | |
| මහජන කේන්ද්‍රීය සෞඛ්‍ය සේවාවක් | **ප්‍රතිචාරාත්මකයි** | **කඩකර ඇත** | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් තොරතුරු ඉල්ලා සිටින ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් අමාත්‍යාංශය සඳහන් කර සිටියේ 2020 මාර්තු මාසය තෙක් ගත වූ කාලය තුළ අයවැය යෝජනාව සඳහා පොරොන්දු වූ මූල්‍ය ප්‍රතිපාදන ඔවුන් වෙත ලැබී නොතිබුණු බවයි. කෙසේ වෙතත්, මධ්‍ය වාර්ෂික ඇගයීම සිදු කිරීමේදී, සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සිදු කරන ලද නිරන්තර සන්නිවේදනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස එම අමාත්‍යාංශය වෙතින් ලැබූ අවසන් ප්‍රතිචාරයෙහි සඳහන් කරන ලද්දේ එම යෝජනාව සිය විෂය පථයට අයත් නොවන්නක් බවයි. | මෙම අයවැය පොරොන්දු ඉදිරිපත් කරන ලද්දේ 2020 නොවැම්බර් මාසයේදී සිදු කරන ලද 2021 අයවැය කතාව මගිනි. එම පොරොන්දුව ඉදිරිපත් කොට වසරකට අධික කාලයක් ගත වී ඇති නමුදු ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන අදාළ අමාත්‍යාංශය වෙත ලබා දී නොමැත. අරමුදල් නොමැති වීමෙන් ප්‍රත්‍යක්ෂ වන්නේ එහි කිසිදු ප්‍රගතියක් තිබිය නොහැකි බවයි. එබැවින්, එම පොරොන්දුව කඩ කරන ලද්දක් ලෙස වර්ගීකරණය කර ඇත. | |
| ළදරුවන් සහ ගර්භණී මාතාවන් | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලදි. පොරොන්දුවට අදාළ ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය අමාත්‍යාංශය විසින් | ලබා දුන් තොරතුරු මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් නොවීය. | |

| | | | |
|---|---|---|---|
| | ලබා දෙනු ලැබූව ද ප්‍රගති වාර්තා කිසිවක් ලබා නොදෙන ලදි. | | |
| ග්‍රාමීය ක්‍රීඩා සංවර්ධනය | **විවෘත** | **දුර්වලයි** | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| | මෙම අමාත්‍යාංශය විසින් 2021 වසර සඳහා වූ ප්‍රගති වාර්තාව සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඇතැම් ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කරන ලදි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලීමක් රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. රාජ්‍ය අමාත්‍යාංශය මධ්‍ය වාර්ෂික ඇගයීම සඳහා තොරතුරු ලබා දුන්න ද, මෙම තොරතුරු ඉල්ලීම සඳහා ඒ වෙතින් එය භාරගත් බවට දැනුම් දීමක් හෝ ප්‍රතිචාරයක් හෝ නොලැබිණ. | 2021 වසර සඳහා වූ ප්‍රගති වාර්තාව මගින් පෙනී යන පරිදි ව්‍යාපෘති 16ක් සඳහා රු. මිලියන 3,000ක් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇත. එම ව්‍යාපෘති 16 ට අදාළ ප්‍රගතිය 2021 ඔක්තෝබර් මාසය දක්වා කාලය සඳහා ලබා දී ඇති අතර එම ව්‍යාපෘති සියල්ලම වෙනුවෙන් රු. මිලියන 2,044 ක ප්‍රතිපාදන ලබා දී ඇත. එක් ව්‍යාපෘතියක් සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ සිදු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස 2021 දෙසැම්බර් මාසය දක්වා අත් කර ගත් ප්‍රගතිය පිළිබඳ විස්තර ලබා දී ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන ඇති බවට සාධක පවතින නමුදු ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම හේතුවෙන් ලබා ඇති ප්‍රගතිය ඉලක්කයන්ට අනුකූල ද යන්න තක්සේරු කිරීම අසීරුය. එමෙන්ම, ප්‍රගති වාර්තාව තුළ දක්වා ඇති ව්‍යාපෘති, අයවැය කතාවෙහි දක්වා ඇති ව්‍යාපෘති අරමුණු හා සමපාත නොවේ. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම නිසා යෝජනාවෙන් බැහැර වීමක් සිදුව තිබේ ද යන්න තහවුරු කිරීමේ හැකියාවක් නොමැත. පැහැදිලි භෞතික ප්‍රගතියක් දක්නට නොලැබීම හේතුවෙන් මෙම අයවැය පොරොන්දුව තක්සේරු කිරීම සඳහා මූල්‍ය ප්‍රගතිය යොදා ගන්නා ලදි. මෙහිදී බෙදා දෙන ලද අරමුදල් භාවිතයෙන් මූල්‍ය ප්‍රගතිය නිර්ණය කරන ලදි. මෙලෙස බෙදා දී ඇත්තේ මෙම යෝජනාව සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් 10%ක් පමණි. එබැවින් මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය දුර්වල යැයි වර්ගීකරණය කර ඇත. | |
| | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| ග්‍රාමීය පාසල් සංවර්ධනය | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටි නමුදු එම ඉල්ලීම භාර ගත් බව දන්වා ලිපියක් එවන ලදමුත් වෙනත් කිසිදු තොරතුරක් ලබා නොදෙන ලදි. එමෙන්ම, අමාත්‍යාංශය සමඟ කිසිදු ආකාරයක සබඳතාවක් ඇති කර ගැනීමට ද නොහැකි විය. | යෝජනාවේ ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා ගත නොහැකි විය. | |
| අපද්‍රව්‍ය කළමනාකරණය - ප්‍රාදේශීය සභා | **විවෘත** | **දුර්වලයි** | පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලදි. කෙසේ වෙතත්, එම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ලබා දුන් තොරතුරු අසම්පූර්ණ විය. එනමුත්, යෝජනාවට අදාළ මූල්‍ය ප්‍රගතිය අන්තර්ජාලය හරහා ප්‍රගාමීව හෙළිදරව් කර තිබීම හේතුවෙන් තක්සේරුව සිදු කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු ලැබිණ. | තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරයෙහි සඳහන් වූයේ හුදෙක් මේ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය රු. මිලියන 3,000 සිට රු. මිලියන 636 දක්වා අඩු කර ඇති බව පමණි. රාජ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කර ඇති මූල්‍ය ප්‍රගති වාර්තාවෙහි මූල්‍ය ප්‍රගතිය 17% ක් ලෙස සඳහන් වන අතර එබැවින්, මෙහි ප්‍රගතිය දුර්වලයි යනුවෙන් වර්ගීකරණය කර ඇත. | |
| යටිතලපහසුකම් - ප්‍රාදේශීය සභා | **විවෘත** | **දුර්වලයි** | පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමී වශයෙන් හෙළිදරව් කර ඇත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලද අතර ඊට ප්‍රතිචාර ලෙස තොරතුරු ලැබිණ. තක්සේරුව සිදු කිරීමට ප්‍රමාණවත් තරම් තොරතුරු ලබා ගත හැකි විය. | 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය 45% ක් ලෙස වාර්තා කර ඇත. | |
| දුරස්ථ අධ්‍යාපනය | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| | ජනාධිපති මාධ්‍ය අංශයේ වෙබ් අඩවිය තුළින් සීමිත තොරතුරු ප්‍රමාණයක් ප්‍රගාමීව හෙළිදරව් කර ඇත. 2021 අයවැයට අදාළ තොරතුරු ඉල්ලා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ යටතේ ඉල්ලීමක් ගොනු කළ ද ඊට ප්‍රතිචාර වශයෙන් තොරතුරු ලබා දෙන ලද්දේ 2022 අයවැය යෝජනාවට අදාළව ය. | මාර්ගගතව හෙළදරව් කර ඇති තොරතුරුවලට අනුව මෙම වැඩසටහන ආරම්භ කරන ලද බවට පැවසෙන යම් යම් තොරතුරු ඇතත් මෙම යෝජනාවෙහි ප්‍රගතිය නොදනී. එබැවින්, මෙම යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කළ නොහැක. | |

| | | | |
|---|---|---|---|
| මහජන ආරක්‍ෂාව | **ප්‍රතිචාරාත්මකයි** | **සැලකිය යුතුයි** | මහජන ආරක්‍ෂක අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින ලදි. අමාත්‍යාංශය විසින් තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර දක්වන ලද අතර ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා එම තොරතුරු ප්‍රමාණවත් විය. | මෙම යෝජනාව යටතේ උපව්‍යාපෘති 24 ක් පවතින අතර ඉන් 6 ක් නිම කර ඇත. ඉතිරි ව්‍යාපෘති අතුරින් 12 ක් 50% ඉක්මවන භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත. එම නිසා, මෙම අයවැය පොරොන්දුව සැලකිය යුතු තරමේ ප්‍රගතියක් අත් කරගෙන ඇතැයි යනුවෙන් වර්ගීකරණය කර ඇත. | |
| ක්‍රීඩා ආර්ථිකය | **සහය නොදක්වන ලදි** | **දුර්වලයි** | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය |
| | මෙම අයවැය පොරොන්දුවේ එක් අංගයකට අදාළ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රගාමීව හෙළිදරව් කර තිබිණ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ද තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලදි. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම අතිරේක සංවර්ධන ලේකම් වෙත යොමු කරන ලද නමුදු ඊට ප්‍රතිචාර වශයෙන් කිසිදු තොරතුරක් නොලැබිණ. | අයවැය කතාව පදනම් කර ගනිමින් මෙම යෝජනාව යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම් 5ක් හඳුනා ගන්නා ලදි. කෙසේ වෙතත්, වෙබ් අඩවි පරීක්ෂාවන් ඔස්සේ ලබා ගත් තොරතුරු අදාළ වූයේ මින් එක් ක්‍රියාකාරකමකට පමණි (එනම්, කෘත්‍රිම ධාවන පථ ඉදිකිරීමට අදාළව). 2021 දෙසැම්බර් මාසය අවසන් වන විට මෙම ක්‍රියාකාරකමෙහි සමුච්චිත ප්‍රගතිය 6% ක් බව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිව්වන කාර්තු වාර්තාවෙහි දැක්වේ. ප්‍රසම්පාදන කටයුතුවලදී සිදු වූ ප්‍රමාදය ඊට අදාළ ප්‍රමාදයන්ට හේතු ලෙස දක්වා තිබේ. ඉහත කී ක්‍රියාකාරකම් පහ අතරින් එකක් ආශ්‍රිතව යම්කිසි ප්‍රගතියක් දැකිය හැකි බැවින් මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීම අරඹා ඇති බවට සාක්ෂි පවතී. එනමුත්, ඉතිරි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තොරතුරු නොමැති බැවින් සමස්ථ පොරොන්දුව ඉටු කිරීමට අදාළ ප්‍රගතිය දුර්වලයි යනුවෙන් වර්ගීකරණය කර ඇත. | |
| ඇවිදින මංතීරු සහ පොදු පහසුකම් | **විවෘත** | **අර්ධ සම්පූර්ණයි** | නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ද රාජ්‍ය අමාත්‍යාංශය විසින් තොරතුරු ලබා දෙන ලදි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම යෝජනාව යටතට ගැනෙන උපව්‍යාපෘති 33 ක් පවතී. ඒ අතරින් යෝජනා බහුතරයක් (එනම්, 13 ක්) 33-66% අතර භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇති අතර යෝජනා 6 ක භෞතික ප්‍රගතිය 80% ඉක්මවයි. එම නිසා, මෙම යෝජනාව අර්ධ සම්පූර්ණ ප්‍රගතියක් | |

| | | | |
|---|---|---|---|
| | | අත්කර ගෙන ඇතැයි යනුවෙන් වර්ගීකරණය කර ඇත. | |
| වැවිලි කර්මාන්ත (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | 1. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>2. සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත භෝග වගා, තේ කර්මාන්තශාලා නවීකරණය හා තේ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>3. පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා<br>අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය<br>4. උක්, බඩඉරිඟු, කජු, කම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| | ප්‍රගාමීව තොරතුරු හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ කැබිනට් අමාත්‍යාංශය වෙතත් රාජ්‍ය ආමාත්‍යාංශ තුන වෙතත් තොරතුරු ඉල්ලීම් ගොනු කරන ලදි. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන 4 අතුරින් 3 ක් වෙතින් (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, සමාගම් වතු ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය සහ සුළු අපනයන භෝග රාජ්‍ය අමාත්‍යාංශය) මීට ප්‍රතිචාර ලැබිණ. එක් එක් ආයතනය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදාන අතර තිබූ විෂමතා මෙන්ම යෝජනාවට අදාළව එක් එක් ආයතනයක් යටතට පත් කරන ලද ක්‍රියාකාරකම් හඳුනාගැනීමේදී මතු වූ දුෂ්කරතා ද හේතුවෙන් මෙලෙස ලැබුණු තොරතුරු ඇගයීම සඳහා යොදා ගැනීම අසීරු විය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙතින් ලැබුණු තොරතුරු අසම්පූර්ණ වන බැවින් එම තොරතුරු යොදා ගනිමින් ප්‍රගතිය නිර්ණය කිරීම සිදු කළ නොහැක. | |
| බිංදු ජල සම්පාදනය (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | 1. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>2. සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත භෝග වගා, තේ කර්මාන්තශාලා නවීකරණය හා තේ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>3. පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා |

| | | | |
|---|---|---|---|
| | | | අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය<br><br>4. උක්, බඩඉරිඟු, කජු, කම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| | ප්‍රගාමීව තොරතුරු හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ කැබිනට් අමාත්‍යාංශය වෙතත් රාජ්‍ය ආමාත්‍යාංශ තුන වෙතත් තොරතුරු ඉල්ලීම් ගොනු කරන ලදි. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන 4 අතුරින් 3 ක් වෙතින් (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, සමාගම් වතු ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය සහ සුළු අපනයන භෝග රාජ්‍ය අමාත්‍යාංශය) මීට ප්‍රතිචාර ලැබිණ. එක් එක් ආයතනය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදාන අතර තිබූ විෂමතා මෙන්ම යෝජනාවට අදාළව එක් එක් ආයතනයක් යටතට පත් කරන ලද ක්‍රියාකාරකම් හඳුනාගැනීමේදී මතු වූ දුෂ්කරතා ද හේතුවෙන් මෙලෙස ලැබුණු තොරතුරු ඇගයීම සඳහා යොදා ගැනීම අසීරු විය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙතින් ලබා දී ඇති තොරතුරු අසම්පූර්ණ වන බැවින් එම තොරතුරු යොදා ගනිමින් ප්‍රගතිය නිර්ණය කිරීම සිදු කළ නොහැක. | |
| ඛනිජ වැලි හඳුනා ගැනීම ලියාපදිංචි කිරීම | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | කර්මාන්ත අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම භාර ගත් බවට අමාත්‍යාංශය විසින් දන්වා එවන ලද නමුදු ඊට අදාළව කිසිදු තොරතුරක් ලබා දී නොමැත. | යෝජනාවේ ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා නොදුන් අතර අන්තර්ජාලය ඔස්සේ ද තොරතුරු පළ කර නොතිබිණ. | |
| සාම්ප්‍රදායික ගම්මාන සංවර්ධනය කිරීම | **ප්‍රතිචාරාත්මකයි** | **සැලකිය යුතුයි** | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලදි. අමාත්‍යාංශය එම ඉල්ලීමට ප්‍රතිචාර ලෙස ලබා දුන් තොරතුරු තක්සේරුව සිදු කිරීමට තරම් ප්‍රමාණවත් විය. | ප්‍රගති වාර්තාවෙහි සටහන් පරිදි මෙම පොරොන්දු ප්‍රධාන උපක්‍රියාකාරකම් 6 න් සමන්විත වේ. මින් 4ක ප්‍රගතිය 80% ඉක්මවා ඇති අතර 1ක ප්‍රගතිය 66-80% අතර වේ. එමෙන්ම, එක් උපක්‍රියාකාරකමකට අදාළ ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් නොමැත. | |

| | | | |
|---|---|---|---|
| විශ්වවිද්‍යාලයීය යටිතල පහසුකම් | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය |
| | පොරොන්දුවට අදාළ ඇතැම් තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇතිමුත්, තක්සේරුවක් සිදු කිරීම සඳහා එම තොරතුරු ප්‍රමාණවත් නොවේ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලදි. මධ්‍ය වාර්ෂික තක්සේරු කිරීම සිදු කිරීමේදී, තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස නගර විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාළ සංකල්ප පත්‍රය රාජ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදි. කෙසේ වෙතත්, වසර අවසාන තක්සේරු කිරීම වෙනුවෙන් ගොනු කරන ලද තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම භාරගත් බවට දැනුම් දීමක් හෝ කිසිදු ප්‍රතිචාරයක් හෝ නොලැබිණ. | මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීම අරඹා ඇති බවට සාක්ෂි අන්තර්ජාලයේ පළ කර ඇති තොරතුරුවලින් ලැබේ (ජනාධිපති මාධ්‍ය අංශයේ වෙබ් අඩවියෙහි පළ කර ඇති ප්‍රකාශයන් සහ නගර විශ්වවිද්‍යාල වෙබ් අඩවිය). කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්මක් හෝ ප්‍රගති වාර්තාවක් නොමැතිකම හේතුවෙන් මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට ක්‍රමයක් නොමැත. එම නිසා, මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය හෙළිදරව් කර නොමැති යැයි වර්ගීකරණය කර ඇත. | |
| ජලාශ ප්‍රතිසංස්කරණය | **ප්‍රතිචාරාත්මකයි** | **ඉටු කරන ලදී** | වාරිකර්මාන්ත අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලදි. අමාත්‍යාංශය එම ඉල්ලීමට ප්‍රතිචාර ලෙස ලබා දුන් තොරතුරු තක්සේරුව සිදු කිරීමට තරම් ප්‍රමාණවත් විය. | ප්‍රගති වාර්තාවලට අනුව මෙම පොරොන්දුව බහු-වාර්ෂික උපව්‍යාපෘති 8න් සමන්විත වේ. භෞතික ප්‍රගතිය සලකා බැලීමේදී එකී උපව්‍යාපෘති 8 ම 2021 වසර සඳහා 80% ඉක්ම වූ වර්ධනයක් වාර්තා කර ඇත. එම නිසා, මෙම පොරොන්දුව ඉටු කරන ලද්දක් ලෙස වර්ගීකරණය කර ඇත. | |

## 3.2. ප්‍රතිපත්ති යොජනා

| | | | |
|---|---|---|---|
| විශේෂ භාණ්ඩ හා සේවා බද්ද | **විවෘත** | **ක්‍රියාත්මක කර නොමැත** | මුදල් අමාත්‍යාංශය - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| | 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් තොරතුරු ලැබිණ. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා මෙම ගැසට් නිවේදනය ලබා ගත හැක. | "විශේෂ භාණ්ඩ හා සේවා බදු" යනුවෙන් හඳුන්වන ලද පනත් කෙටුම්පත 2022 ජනවාරි 7 වැනි දින ගැසට් කරන ලද අතර 2022 ජනවාරි 20 දින මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත්, එම පනතට එරෙහිව පෙත්සම් කිහිපයක්ම ගොනු කරනු ලැබිණ. එම පෙත්සම් විභාග කළ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව වූයේ එකී පනත් කෙටුම්පතෙහි ඇතුළත් ඇතැම් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන බවයි. මෙම පනත් කෙටුම්පත සම්මත කිරීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරය සහ ජනමත විචාරණයකින් ජනතාවගේ අනුමැතිය අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ලැබීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පතට අදාළව කිසිදු තොරතුරක් ලබා ගත නොහැකි වූ අතර, ජනමත විචාරණයක්ද පවත්වනු නොලැබිණ. එම නිසා, මෙම පනත් කෙටුම්පත ක්‍රියාත්මක කර නොමැති යෝජනාවක් සේ වර්ගීකරණය කර ඇත. | |
| කොවිඩ් රක්ෂණ යෝජනා ක්‍රමය | **ප්‍රතිචාරාත්මකයි** | **සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත** | මුදල් අමාත්‍යාංශය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | පොරොන්දුව ආශ්‍රිත සීමිත තොරතුරු ප්‍රමාණයක් අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර තිබිණ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් තොරතුරු ලැබුණු අතර තක්සේරුවක් සිදු කිරීම සඳහා එම තොරතුරු ප්‍රමාණවත් විය. | ප්‍රතිලාභීන් රෝහල්ගත කිරීම අවශ්‍ය වූ සෑම රක්ෂණාවරණයක් සඳහාම අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය හරහා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවන ලද බව ලබා දුන් තොරතුරු සැලකීමේදී පෙනී යයි. කොවිඩ් ආසාදනය වී නිවසේ සිට ප්‍රතිකාර ලැබූ රෝගීන් ද මෙම යෝජනාව සඳහා ඇතුළත් කර ගන්නා ලදි. මීට අමතරව, නිරෝධායනයට ලක් කරන ලද පවුල් වෙත සහ කොවිඩ් රෝගීන් සඳහා සෞඛ්‍යාරක්ෂණ සේවා ලබා දීමෙහි නිරතව සිටි සෞඛ්‍ය අංශවල ඉදිරිපෙළ සේවකයින් වෙත ලබා දුන් මූල්‍ය සහන පිළිබඳව ද මෙම ප්‍රතිචාරයෙහි සඳහන් වේ. | |
| විදේශ රැකියාවල නියුතු ශ්‍රමිකයින් සඳහා දායකත්ව විශ්‍රාමි වැටුප් යෝජනා ක්‍රමය | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | කම්කරු අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව ආශ්‍රිත සීමිත තොරතුරු ප්‍රමාණයක් අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර තිබිණ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලීමක් ගොනු කරන ලදි. කම්කරු අමාත්‍යාංශය විසින් තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම භාර ගන්නා ලද අතර එය විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. කෙසේ වෙතත්, රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් එයට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණ. | තොරතුරු කිසිවක් ලබා නොදුන් අතර අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර තිබූ තොරතුරු යෝජනාවට අදාළ ප්‍රගතිය තක්සේරු කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. | |
| ගොවිජන සංවර්ධන පනත | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලදි. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම භාර ගත් අතර එය කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන | තොරතුරු කිසිවක් ලබා නොදුන් අතර අන්තර්ජාලය ඔස්සේ ද යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අවශ්‍ය තොරතුරු පළ කර නොතිබිණ. | |

| | | | |
|---|---|---|---|
| | සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. එම තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම ඉන් අනතුරුව තවදුරටත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද නමුත් එම දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා ප්‍රතිචාරයක් නොලැබිණ. | | |
| වතු කම්කරුවන්ගේ දෛනික වැටුප ඉහළ නැංවීම | **විවෘත** | **සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත** | කම්කරු අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් ප්‍රගාමීව තොරතුරු හෙළිදරව් කරන ලදි. මීට අදාළ ගැසට් නිවේදනය සහ ඊට හිමි වූ කැබිනට් අනුමැතිය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කර තිබිණි. | ගැසට් නිවේදනය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇති අතර එය 2021 මාර්තු 5 දින සිට බලාත්මක වනු ඇතැයි සඳහන්ව තිබුණි. කෙසේ වෙතත්, මෙම පොරොන්දුව සහ ගැසට් නිවේදනය අතර නොගැලපීමක් පවතී. මෙහිදී අවම වැටුපට රු. 900 ක අවම දෛනික වැටුප සහ අයවැයෙන් ලබා දුන් රු. 100 ක සහන දීමනාව ඇතුළත් වේ. මේ අනුව, අවම වැටුප සැබවින්ම ඉහළ නංවා ඇත්තේ රු. 900 දක්වා පමණි. කෙසේ නමුත්, මේ සඳහා කැබිනට් අනුමැතිය හිමිව ඇති බැවින් ද එය ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් ද මෙම පොරොන්දුව සම්පූර්ණව ක්‍රියාත්මක කරන ලද්දක් ලෙසට සලකා ඇත. | |
| ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් විදුලිබල අමාත්‍යාංශය වෙත ගොනු කරන ලදි. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා නොදුන් අතර අන්තර්ජාලය ඔස්සේ ද එම තොරතුරු පළ කර නොතිබිණ. | |

| | | | |
|---|---|---|---|
| | සභාව මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බව 2022 මාර්තු 8 දින ඊට ලැබුණු ප්‍රතිචාරයෙහි සඳහන් විය. එම නිසා, මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතට අදාළ තොරතුරු ඉල්ලා සිටීමේ අරමුණින් එම ඉල්ලීම නැවතත් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. එම ඉල්ලීම ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත යොමු කරන ලදි. කෙසේ වෙතත්, ඒ ඔස්සේ තොරතුරු කිසිවක් ලබා ගත නොහැකි විය. | | |
| ලංකා විදුලිබල මණ්ඩල පනත සංශෝධනය කිරීම | **සහය නොදක්වන ලදි** | **ක්‍රියාත්මක කර නැත** | විදුලිබල අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් යොමු කරන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් තොරතුරු ලැබිණ. | ලංකා විදුලිබල මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව විදුලිබල අමාත්‍යාංශය සඳහන් කරයි. | |
| බතික් නිෂ්පදන ආනයනය තහනම් කිරීම | **විවෘත** | **සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත** | බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය |
| | ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර තිබිණ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ රාජ්‍ය අමාත්‍යාංශය වෙත තොරතුරු ඉල්ලීමක් යොමු කරන ලදි. කෙසේ වෙතත්, මෙහිදී සලකා බැලෙන අයවැය යෝජනාවට අදාළ තොරතුරු කිසිවක් එම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද ප්‍රගති වාර්තාවට ඇතුළත් නොවීය. | ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් දක්වා තිබූ ගැසට් නිදෙව්නයට අනුව, බතික් ක්‍රියාවලියක් ඔස්සේ නිෂ්පාදනය කර ඇති ඇඟළුම් අයිතම, රෙදිපිළි ආදිය නියෝජනය කරන 62.03, 62.04,62.05, 62.06, 62.07, 62.08, 62.11, 62.13, 62.14, 63.02 යන ශීර්ෂ යටතට ගැනෙන අයිතම 2020 දෙසැම්බර් 15 දින සිට ශ්‍රී ලංකාවට ආනයනය කිරීම වළක්වා ඇත. | |
| මූල්‍ය සමාගම් ඒකාබද්ධ කිරීම | **සීමිත** | **හෙළිදරව් කර නොමැත** | මුදල් අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | පොරොන්දුව ආශ්‍රිත සීමිත තොරතුරු ප්‍රමාණයක් අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර තිබිණ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලීමක් ගොනු කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද නමුදු ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණ. | තොරතුරු කිසිවක් ලබා නොදුන් අතර අන්තර්ජාලය ඔස්සේ හෙළිදරව් කර තිබූ තොරතුරු යෝජනාවට අදාළ ප්‍රගතිය තක්සේරු කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. | |
| මුදල් පනත සංශෝධනය කිරීම | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | හඳුනා ගෙන නොමැත |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලදි. එම තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය සඳහන් කර සිටියේ මෙම යෝජනාව සිය අමාත්‍යාංශයේ විෂය පථය යටතට නොගැනෙන බවත්, අදාළ තොරතුරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ලබා ගත හැකි වනු ඇති බවත් ය. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියෙකු හා පවත්වන ලද සංවාදයකදී එවැනි යෝජනාවක් පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැති බව හෙළි වූ අතර අනතුරුව මෙම ඉල්ලීම කම්කරු අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. කම්කරු අමාත්‍යාංශය ද එවැනි යෝජනාවක් පිළිබඳව දැන සිටියේ නැත. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා නොදුන් අතර අන්තර්ජාලය ඔස්සේ ද එම තොරතුරු පළ කර නොතිබිණ. | |
| වරක් පමණක් භාවිතා කරන පොලිතීන් තහනම් කිරීම | **විවෘත** | **ක්‍රියාත්මක කර ඇත** | පරිසර අමාත්‍යාංශය |
| | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර තිබිණ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ රාජ්‍ය අමාත්‍යාංශය | 2211/51 අංකය දරන ගැසට් නිවේදනය මගින් 2021 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් වරක් පමණක් භාවිතා | |

| | | | |
|---|---|---|---|
| | වෙත තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලදි. ඊට ප්‍රතිචාර වශයෙන් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද තොරතුරු තක්සේරුව සිදු කිරීමේදී ප්‍රයෝජනවත් විය. | කෙරෙන පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය තහනම් කෙරේ. | |
| ස්වයං-රැකියාවල නිරත වන පුද්ගලයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **සංවෘත** | **හෙළිදරව් කර නොමැත** | කම්කරු අමාත්‍යාංශය |
| | තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීමක් ගොනු කරන ලද නමුත් ඊට ප්‍රතිචාර වශයෙන් කිසිදු තොරතුරක් නොලැබිණ. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් ලබා නොදුන් අතර අන්තර්ජාලය ඔස්සේ ද එම තොරතුරු පළ කර නොතිබිණ. | |
| විශ්‍රාම ගැනීමේ වයස දීර්ඝ කිරීම | **විවෘත** | **සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත** | කම්කරු දෙපාර්තමේන්තුව |
| | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර තිබිණ. | "2021 අංක 28 දරන සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත" නම් වූ පනත 2021 නොවැම්බර් 17 දින සහතික කරන ලදි. | |

# වගකීම්හරණය

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු රජයේ වාර්තා, නිල ප්‍රකාශන, මහජන වාර්තා සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් ඔස්සේ ලැබෙන තොරතුරු ඇසුරින් සම්පාදනය කර ඇත. මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු වෙරිටේ රීසර්ච් ආයතනයේ හෝ එහි සාමාජිකයින්ගේ හෝ පෞද්ගලික අදහස් හෝ මතය පිළිබිඹු නොකරයි. වේදිකාවේ ඇතළත් තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි හෝ එසේ වූ බවට කියැවෙන කිසිදු අලාභයකට හෝ කීර්ති නාමයට හානි කිරීම ඇතුළුව කිසියම් අලාභයක් හෝ හානියක් සඳහා වෙරිටේ රීසර්ච් ආයතනය කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ.

මෙම වේදිකාවේ පළ කර ඇති තොරතුරු විශ්වාසදායක ප්‍රභවයන්ගෙන් ලබාගෙන ඇති බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර, තොරතුරුවල ඇති කිසිදු දෝෂයකට, මගහැරීමකට හෝ එම තොරතුරු භාවිතයෙන් ලබාගත් ප්‍රතිඵල සඳහා හෝ වෙරිටේ රීසර්ච් සහ budgetpromises.org කණ්ඩායමෙහි සාමාජිකයින් වගකිව යුතු නොවේ. වෙරිටේ රීසර්ච් ආයතනයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව මෙම වේදිකාවේ අන්තර්ගතයන් වෙනස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම, සම්ප්‍රේෂණය කිරීම, හුවමාරු කිරීම, විකිණීම, පිටපත් කිරීම, ව්‍යුත්පන්න කෘති නිර්මාණය කිරීම, බෙදා හැරීම, නැවත පළ කිරීම, රඟ දැක්වීම, ප්‍රදර්ශනය කිරීම සහ කිසිදු ආකාරයකින් වාණිජමය වශයෙන් භාවිතා කිරීම සඳහා පරිශීලකයින්ට අවසර නොමැත.

එමෙන්ම, වෙරිටේ රීසර්ච්හි පූර්ව අවසරය ඇතිව හෝ නැතිව, පූර්වයෙන් ලබාගත් තොරතුරක් පසුකාලීනව භාවිතා කිරීමෙන් උද්ගතවන ප්‍රතිඵල සඳහා budgetpromises.org වගකිව යුතු නොවේ.

budgetpromises.org කිසිදු දේශපාලන පක්ෂයක් සහ / හෝ දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත සංවිධානයක් වෙත සහය දැක්වීම, අනුමත කිරීම, නියෝජනය කිරීම සහ ඒ සමඟ සම්බන්ධ වීම ආදිය සඳහා කටයුතු නොකරයි. විශ්ලේෂණ සඳහා භාවිතා කෙරෙන දර්ශක හුදෙක් කාර්ය සාධනයේ සංඛ්‍යානමය අනුමානයන් පමණකි.

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු පරිශීලකයින් දැනුවත් කිරීම සඳහා නොමිලයේ සපයනු ලැබේ. එම තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වෙරිටේ රීසර්ච් හෝ budgetpromises.org කණ්ඩායමේ සාමාජිකයින් සහ කිසියම් පරිශීලකයෙකු අතර එකඟතාවයක් හෝ අවබෝධතාවක් නොපවතී.

මෙම වේදිකාව, දත්ත මගින් ප්‍රදර්ශනය කෙරෙන ප්‍රවණතා දැක්වීමට සහ ඒවා පිළිබිඹු කිරීමට budgetpromises.org විසින් සකස් කරන ලද ස්වාධීන විශ්ලේෂණ ලිපිවලින් සමන්විත වේ. එවැනි විශ්ලේෂණ ලිපි පිටපත් කිරීම වෙරිටේ රීසර්ච් හි පූර්ව අවසරය ඇතිව සිදු විය යුතුය.